**අද (30) ගාල්ල නගර ශාලාවේ පැවැති ජනතාවාදී ඒකාබද්ධ විපක්ෂයේ ගාල්ල දිස්ත්‍රික් සම්මන්ත්‍රණය අමතා ඒකාබද්ධ විපක්ෂයේ කැඳවුම්කරු මහාචාර්ය ජී. එල්. පීරිස් මහතා කළ කතාව**

සමහරු අපෙන් අහනවා, රජය දැන් 22 වැනි සංශෝධනයෙන් යෝජනා කරන්නේ විනිශ්චයකාරවරුන්ගේ නිල කාලය අවුරුදු දෙකකින් වැඩි කරන්න. ඉතින් මේක ලොකු ප්‍රශ්නයක්ද? අපි මෙච්චර කලබල වෙන්න ඕනෙද කියලා?

මම වගකීමෙන් කියනවා, මේක කිසිසේත් සිල්ලර කාරණයක් නෙවෙයි. අපි මෙතෙක් දුරට භුක්ති විඳපු, අගය කරපු ප්‍රජාතන්ත්‍රවාදී සංස්කෘතිය, මිනිස් අයිතිවාසිකම් තවදුරටත් ආරක්ෂා කරගන්නවාද, එහෙම නැත්නම් ඒ සියල්ලක්ම විනාශ වීමට අපි ඉඩ තියෙනවාද කියන ප්‍රශ්නයට තමයි අපි අද මුහුණ දෙන්නේ.

රජයේ පැත්තෙන් ඉතාමත් භයානක ප්‍රකාශ දැනටමත් කෙරිලා තියෙනවා. කිසිම පැකිලීමකින් තොරව කියලා තියෙනවා වර්තමාන රජයේ බලධාරීන්, 'අපි ඇවිල්ලා ඉන්නේ අවුරුදු පහකට ආණ්ඩු කරන්න නෙවෙයි. අපි හුඟක් දුක් විඳලා මේ තනතුරුවලට පැමිණියේ. අවුරුදු 20ක් 25ක් අපි මේ බලය හසුරුවනවා. අපිව හොල්ලන්න බැහැ. අපි ලබාගත් බලය ලේසියෙන් අතහරින්නේ නැහැ.' එළිපිට, ප්‍රසිද්ධියේ මෙහෙම ප්‍රකාශන දිගින් දිගටම කරනවා. 'අපිට බලය තියෙනවා. අපි ලබාගත් බලය අතහරින්න අපිට කිසිම සූදානමක් නැහැ.' කියලා.

පැහැදිලිව කියලා තියෙනවා පළාත් සභා මැතිවරණ තියන්නේ නැහැ. අපි තීරණය කරනවා, කවුරු මොනවා කිව්වත් කමක් නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ මැතිවරණ පැවැත්වෙන්න ඕනේ. හැබැයි අපි තීරණය කරනවා පළාත් සභා මැතිවරණ නැත.

මේ රජය පත්වුණේ අවුරුදු පහකට. අවුරුදු පහකට පස්සේ ජනාධිපතිවරණයක් පැවැත්වෙන්න ඕනේ. පාර්ලිමේන්තු මැතිවරණයක් පැවැත්වෙන්න ඕනේ. හැබැයි මේ අහංකාර ආකල්පය නිසා අපිට සැකයක් තියෙනවා, පළාත් සභා ප්‍රතික්ෂේප කරනවා වගේම අවුරුදු පහකට පස්සේ ජනාධිපතිවරණයත් කල් දාන්න උත්සාහ කරයිද? පාර්ලිමේන්තු මැතිවරණ නිසිකලට තියයිද? මේ පිළිබඳව ප්‍රශ්නාර්ථයක් තියෙනවා.

ආණ්ඩුවේ ඇමතිවරුන් කියනවා, 'අපිට දැන් තියෙන්නේ ආණ්ඩු බලය පමණයි, අපි ඒකෙන් සෑහීමට පත්වන්නේ නැහැ. අපිට ඕනේ රාජ්‍යයේ මර්මස්ථාන සියල්ලම අපේ ග්‍රහණයට නතු කරගන්න.' මොනවාද මර්මස්ථාන? පොලීසිය, රාජ්‍ය සේවය, සේරටම වඩා වැදගත් වන්නේ අධිකරණය. මේ සියලුම ආයතන අපේ සෘජු පාලනයට අපි අරන් තියාගන්නවා. එහෙම නැත්නම් අවුරුදු පහකට රාජ්‍ය පාලනය කරලා පමණක් අපි සෑහීමට පත්වන්නේ නැහැ. අපේ අරමුණ ඒක නෙවෙයි. ඊට හුඟක් ඔබ්බට ගිහිල්ලා තියෙන අරමුණක්.

ස්වාධීන අධිකරණයක් නැත්නම් කිසිම මිනිස් අයිතිවාසිකමක් භුක්ති විඳීමට අපිට පුළුවන්කමක් නැහැ.

අද අප ඉදිරියේ තියෙන්නේ විකල්ප දෙකක්. එච්චරයි, වෙන මුකුත් නැහැ, විකල්ප දෙකක්. නිදහස්, නිවහල් පුරවැසියන් හැටියට අපි තවදුරටත් මේ රටේ ජීවත් වෙනවාද, එහෙම නැත්නම් අපේ ස්වාමීන් වහන්ස, අනෙක් විකල්පය තමයි ඒකාධිපති රාජ්‍යයක් කරා යන මෙම ගමනට අපි හිස නමලා ඒකට කොටස්කරුවන් වෙනවාද කියන මෙන්න මේ විකල්ප දෙක පමණයි අද අපේ ජනතාව ඉදිරියේ තියෙන්නේ. වෙන කිසිවක් නැහැ. එතකොට දැන් කාලය ඇවිල්ලා තියෙනවා මේ දෙකෙන් එකක් තෝරා ගැනීමට.

දැන් මේක කිසිසේත් ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට තව අවුරුදු දෙකක් දීර්ඝ කිරීමක් නෙවෙයි. මේ තුළ සැඟවුණු අරමුණක් පැහැදිලිව තියෙනවා.

තව දවස් තුනකින් අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයෙක් විශ්‍රාම ගන්නවා. සැප්තැම්බර් දෙවනදා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයෙක් විශ්‍රාම ගන්නවා. මේ ආණ්ඩුව ගෙනෙන්න බලාපොරොත්තු වන සංශෝධනය සති දෙකකට ඉස්සෙල්ලා ගෙනාවා නම්, ඒ විනිශ්චයකාරතුමාට තව අවුරුදු දෙකක් ඒ විනිශ්ච ආසනයේ සිටීමට පුළුවන්. සති දෙකක් පහුකරනවා නම්, එතුමාට ගෙදර යන්න සිද්ධ වෙනවා. එතකොට මේක ලෝතරැයියක්ද? සති දෙකක් ඉස්සෙල්ලා ගේනවා නම් විනිශ්චයකාරතුමා තවදුරටත් ඉන්නවා, සති දෙකක් පහුකරනවා නම් විනිශ්චයකාරතුමා ගෙදර යනවා. ලෝතරැයියකට වඩා භයානක තත්ත්වයක්. එතකොට ආණ්ඩුව තමයි තීරණය කරන්නේ කොයි විනිශ්චයකාරවරුන්ටද තවදුරටත් සේවය කරන්නේ, කොයි විනිශ්චයකාරවරුන්ද කියලා ගෙදර යවන්නේ.

මේ අවුරුද්දේ මෙතෙක් දුරට ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හතරදෙනෙක් විශ්‍රාම අරන් තියෙනවා. ඒගොල්ලෝ ගිහිල්ලා ඉවරයි. දැන් මේ සංශෝධනය මේ අවුරුද්ද මුලදී ගෙනාවා නම්, ඒ විනිශ්චයකාරවරුන් හතරදෙනා තව අවුරුදු දෙකක් සේවය කරනවා. හැබැයි එහෙම යෝජනාවක් ගෙනාවේ නැහැ. ඒ අය ගෙදර යනතුරු බලා සිටියා.

මේ අවුරුද්ද මුලදී හිටපු අග්‍ර විනිශ්චයකාරතුමිය, මුර්දු ප්‍රනාන්දු විනිශ්චයකාරතුමිය විශ්‍රාම ගියා. ඉතාමත් ගෞරවාන්විත සේවයක් අපේ රට වෙනුවෙන් ඉෂ්ට කරලා. කිසිම විවේචනයක් තිබුණේ නැහැ. එතුමියගේ නිල කාලය දීර්ඝ කිරීම පිළිබඳව කිසිම යෝජනාවක් තිබුණේ නැහැ. එතුමිය සේවය කරලා විශ්‍රාම ගන්න වයස ආවාම එතුමියට ගෙදර යන්න ඉඩ දුන්නා.

මොකක්ද මේ කරන්නේ? තෝරා බේරාගෙන, මෙන්න මේ කට්ටිය ගෙදර යවනවා, මේ කට්ටිය අපි තවදුරටත් තියාගන්නවා. කවුද ඒ තීරණය ගන්නේ? ආණ්ඩුව ඒ තීරණය ගන්නවා. අන්න ඒකයි මෙතන තියෙන ප්‍රශ්නය.

වෙන රටවල්වල මෙහෙම නෙවෙයි. සාමාන්‍ය සම්ප්‍රදාය තමයි විනිශ්චයකාරවරුන්ගේ වයස විශ්‍රාම ගන්න වයස වැඩි කරන්න වුවමනා නම්, අනාගතයේ ඒ විනිශ්චය ධූරවලට පත්වෙන විනිශ්චයකාරවරුන් සම්බන්ධයෙන් ඒ වෙනස ක්‍රියාත්මක කරනවා. ඒ විනිශ්චයකාරවරයා පත්වීම් ගන්නකොට විනිශ්චයකාරවරයා දන්නවා මෙන්න මේ කාලය තමයි කියලා මම සීමා වෙන්නේ. හැබැයි එහෙම කරන්නේ නැතුව තෝරලා බේරලා තමන්ට කැමති අය තියාගෙන, අකමැති අය ගෙදර යවන ආණ්ඩුව වැඩපිළිවෙලක් සකස් කරනවා නම්, ඒක තමයි අධිකරණයේ ස්වාධීනත්වයේ මළගම. ඒකට තමයි අපි විරුද්ධ.

අද අපේ රටේ තිබෙන ආයතන අතුරින් ජනතාවගේ ගෞරවයට, විශ්වාසයට ලක්වෙලා තිබෙන ප්‍රධාන ආයතනය තමයි ශ්‍රී ලංකා අධිකරණය. අපිට ඕනේ ඒක ඒ විදිහටම තියාගන්න. රජයේ මේ කූට වැඩපිළිවෙල නිසා අධිකරණයේ ආත්මගරුත්වයට, තේජසට කිසිම හානියක් වෙනවාට අපි තරයේ විරුද්ධයි. අන්න ඒ නිසා තමයි අපි මෙච්චර මහන්සි වෙලා මේ වැඩපිළිවෙල ඉදිරියට අරන් යන්නේ.

රජයේ සම්පූර්ණ තර්කය වංචාවක්. මේකට මොකක්ද දෙන හේතුව? ඇයි මේ 22 වන සංශෝධනය ගේන්නේ? මොකක්ද සඳහන් කරන්නේ? ආණ්ඩුව කියනවා ඒගොල්ලන්ගේ අරමුණ තමයි මේ ගොඩගැහිලා තියෙන නඩු ඉක්මනින් විසඳීමට ආධාරයක් හැටියටයි කියලා මේ 22 වන සංශෝධනය ගේන්නේ. නීතියේ ප්‍රමාද වැළැක්වීම සඳහා. සම්පූර්ණ මිත්‍යාවක්.

පොඩ්ඩක් හිතලා බලන්න, දැන් සේවය කරන විනිශ්චයකාරවරුන්ගේ කාලය තව අවුරුදු දෙකක් දික් කිරීමෙන් නඩු ඇසීම ඉක්මන් වෙනවාද? මේ අවුරුද්දේ විනිශ්චයකාරවරයෙකු කරපු වැඩට සාපේක්ෂව දෙගුණයක්, මේ අවුරුද්දේ කරාට වඩා දෙගුණයක් ඒ විනිශ්චයකාරවරයා ඊළඟ අවුරුද්දේ කරනවාද? එහෙම කරන්න පුළුවන් ද?

නඩු ඇසීම ඉක්මන් කිරීමට මේක කිසිසේත් රුකුලක්, ආධාරයක් වන්නේ නැහැ. මේක නෙවෙයි විසඳුම. ප්‍රශ්නයක් තියෙනවා. නඩු එකොළොස් ලක්ෂයක් මේ රටේ ගොඩගැහිලා තියෙනවා. හැබැයි ඒ ප්‍රශ්නයට විසඳුම දැන් සේවය කරන විනිශ්චයකාරවරුන්ගේ කාලය දීර්ඝ කිරීම නෙවෙයි, විනිශ්චයකාරවරුන්ගේ සංඛ්‍යාව වැඩි කරන්න, දිවයිනේ සෑම ප්‍රදේශයකම අලුත් අධිකරණ ස්ථාපිත කරන්න ඕනේ.

ඒ වගේම නීතිය පසඳලීමේ ක්‍රියාදාමයට කෙලින්ම සම්බන්ධ වෙන ආයතනවල තියෙන දුර්වලතා ඉවත් කිරීම සඳහා ප්‍රායෝගික වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන්න ඕනේ. දැන් බලන්න නීතිපති දෙපාර්තමේන්තුව, පොඩ්ඩක් හොයලා බලන්න

අවුරුද්දකට කීදෙනෙක් ඒකෙන් අයින්වෙලා යනවාද කියලා. කීදෙනෙක් අයින්වෙලා යනවාද? නීතිපති දෙපාර්තමේන්තුවට හරි අමාරුයි ඒගොල්ලන්ගේ දක්ෂ නිලධාරීන් තියාගන්න.

රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, මුදල් ප්‍රශ්න තියෙනවා, උපකරණ පිළිබඳ ප්‍රශ්න තියෙනවා, රසායනාගාර පහසුකම් පිළිබඳ ප්‍රශ්න තියෙනවා. රස පරීක්ෂක දෙපාර්තමේන්තුව ඉතාමත් ඒගොල්ලන්ගේ වැඩකටයුතු කිරීම සම්බන්ධයෙන් විශාල අසීරුතා තියෙනවා. ඒවා විසඳන්න රජය ප්‍රමාණවත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරලා නැහැ.

නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව, විශාල ප්‍රමාද තියෙනවා. මුදල් ප්‍රශ්න, කළමනාකරණ ප්‍රශ්න රාශියක් තියෙනවා.

ඒ වගේම උසාවිවල නඩු අහන ක්‍රමය, උසාවියකට ගිහිල්ලා බලන්න උදේ කාලය පැය කීයක් නාස්ති වෙනවාද කියලා. වෙන රටවල්වල ප්‍රාරම්භක සාකච්ඡා තියෙනවා පාර්ශවකරුවන් අතර. උසාවියේ කාලය ඉතිරි කරගැනීමට පුළුවන් වෙනවා. එතකොට ඒ නිසා නඩු අහන ක්‍රමවේදයේ, ක්‍රියා පරිපාටිය පිළිබඳ කාලෝචිත වෙනස්කම් කරන්න ඕනේ.

ඒවා මුකුත් නොකර, ඒ කිසිවක් ගැන අවධානයක් යොමු කරන්නේ නැතුව, දැන් සේවය කරන විනිශ්චයකාරවරුන්ගේ කාලය දීර්ඝ කිරීමෙන් පමණක් මේ ප්‍රශ්නය කිසිසේත් විසඳන්න පුළුවන්කමක් නැහැ. නීතියේ ප්‍රමාද කොහෙත්ම අඩුවන්නේ නැහැ. එතකොට තිබෙන ප්‍රශ්නයයි, යෝජිත ප්‍රතිකර්මයයි අතර කිසිම සම්බන්ධයක් නැහැ. ප්‍රශ්නයක් තියෙනවා, ඒ ප්‍රශ්නය විසඳීම සඳහා ඉතාමත් වංචනික, කිසිසේත් වලංගු නොවන යෝජනාවක් ඉදිරිපත් කරලා තියෙනවා. මේකෙන් රටේ ජනතාව තමන්ගේ ප්‍රශ්න උසාවියට යොමු කරලා ඉක්මනට විසඳුම් ලබාගැනීමට මේකෙන් කිසිම උපකාරයක් නොලැබෙන බව වගකීමෙන් යුතුව අපි ප්‍රකාශ කරනවා.

## මෙහිදී අදහස දැක්වූ එක්සත් ජාතික පක්ෂ සභාපති වජිර අබේවර්ධන මහතා,

අලුත් පරම්පරාව අපේ චාමර ඇමතිතුමා කිව්වා වගේ දන්නේ නැහැ ගොඩක් දේවල්, විශේෂයෙන්ම මේ ස්ථානය ගත්තොත්, 1988 දී මේ වහල සම්පූර්ණයෙන්ම කඩාගෙන වැටුණා. කිලෝ 100ක විතර බෝම්බයක් නිසා.

මම එතකොට පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක්. මේ අපේ පිටිපස්සේ තියෙන ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයේ වහල කඩාගෙන වැටුණා. හින්දු කෝවිල කඩාගෙන වැටුණා. දැන් අලුත් පරම්පරාව මේවා දන්නේ නැහැ.

මේක තමයි මේ ශාලාවේ ඉතිහාසය. දකුණු පළාත් සභාවේ මන්ත්‍රීවරු 55 දෙනාව දවල් 12:30ට මරලා දාන්න තමයි මේ බෝම්බය තිබ්බේ.

විශාල පිරිසගේ වාහන සේරම සුනුවිසුනු වුණා. 1988 දී ඒ කාලේ ජනතා විමුක්ති පෙරමුණේ නායකත්වය දීපු සමහර අය මෙතන ඉන්නවා. සමහර අය නීතිඥ මහත්වරු මෙතන ඉන්නවා. අද ඒ තුමන්ලා ජනතා විමුක්ති පෙරමුණේ නැහැ. ඒ තමයි ඉතිහාසය.

ගාල්ල දිස්ත්‍රික්කයේ කාටවත් වරදක් නොකරපු, බෝසතෙක්... වගේ ඉඳපු, දීසා ඇමති ජී.වී. එස්. සිල්වා, සිල් අරගෙන ශිල්පවාරණය කරලා එනකොට සිල් රෙද්දත් එක්කම වෙඩි තියලා මරලා දැම්මා. ඒ තමයි ඉතිහාසය.

එවකට මහා ඇමති එම්. එස්. අමරසිරි මැතිතුමා, එතුමා ගියේ වෙඩි නොවදින කාර් එකේ. එතුමාගේ නෝනා ගියේ වෙඩි වදින කාර් එකේ. නෝනාට වෙඩි තියලා මරලා දැම්මා.

බස් ස්ටෑන්ඩ් එකේ හිටපු නන්දපාලට වෙඩි තියලා මරලා දැම්මා. වරායේ වැඩ කරපු මහින්දපාලට වෙඩි තියලා මරලා දැම්මා. උඩුගම්පල පවුල, 9ක් එකට දාලා පුච්චලා වෙඩි තිව්වා. මේ තමයි ගාල්ලේ ඉතිහාසය.

රංජිත් කුමාරගේ මහත්තයාට වෙඩි තිව්වා, නමුත් දුක් විඳිමින් එතුමා තාම ජීවත් වෙනවා. එතුමාගේ නෝනා මැරුණා, අදත් දුක් විඳිනවා. එහෙම ඉතිහාසයක්!

බලන්නකෝ මාධ්‍යයෙන් කරපු වැඩේ! අර චම්පික ඇමතිතුමා කිව්වා වගේ අපරාධකරුවන්ට විරුද්ධව ක්‍රියා නොකරපු පාලනයක් තිබුණු ඉතිහාසයක් එහෙම වැඩ කරාට පස්සේ අද ඇවිල්ලා කියනවා අපිට හුරුයි කියලා.

මං දන්නවා ඔබතුමන්ලාට ගොඩක් අමාරුයි. ඊයේ රෑ පාන් පිටි ටිකට ගැහුවා, කිරිපිටි පැකට් එකට ගැහුවා. තව ටික දවසක් යනකොට ගොඩක් අමාරු වෙනවා. මට මතකයි ගාල්ල නගරයේ මහා පෝලිම්, මට මතකයි ගෑස් ටැංකි තියාගෙන ඉන්නවා කොටු තාප්පය වටේ.

කොහොම හරි කමක් නැහැ එතුමන්ලා එකතු වෙලා, එක්සත් ජාතික පක්ෂයට කරන්න බැරි වෙච්ච වැඩේ, පොදුජන එක්සත් පෙරමුණත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, අනිත් දේශපාලන පක්ෂත් - මෙතන ඉන්නවා මහජන පක්ෂය ඇතුළු දේශපාලන පක්ෂ, සමසමාජ පක්ෂය, කොමියුනිස්ට් පක්ෂය ඇතුළු අලුත් දේශපාලන පක්ෂ එකතු වෙලා රනිල් වික්‍රමසිංහ මැතිතුමාව ජනාධිපති කරාට සියලු දේශපාලන පක්ෂ වලට උණුසුම් ප්‍රශංසාවක් ලබා දෙන්න ඕන මිත්‍රවරුනි.

එහෙම තමයි රටකට තීරණ ගන්නේ මිත්‍රවරුනි.

අපේ නායකයා ගාල්ල නගරයට සම්බන්ධයි. එතුමාගේ මුතුන් මිත්තන් බද්දේගමට සම්බන්ධයි. එතුමාගේ සීයා රිච්මන්ඩ් විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමයේ සභාපති, කොළඹ ශාඛාවේ. ලොකු ඉතිහාසයක්!

ඒකාබද්ධ විපක්ෂයේ අපි එකතු වෙලා තියෙන්නේ මොකටද? අර චාමර ඇමතිතුමා කිව්වා වගේ තානාන්තර ගන්න නෙමෙයි. අපි එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකවරු, ආසන වල ඉන්න සියලු දෙනා මෙතන ඉන්නවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සියලු දෙනා මෙතන ඉන්නවා. ගාල්ල දිස්ත්‍රික්කයේ අපි ඔක්කොම එකට සමගියෙන් ක්‍රියා කළොත් පමණයි මේ වැඩේ ඉවර කරන්න පුළුවන්.

මට එක සාක්ෂියක් දෙන්න පුළුවන්. වැඩි කල් යන්නේ නැහැ. දැන් ගොඩක් අය කියනවනේ 159ක් ඉන්නවා කියලා. සමහර අයට බය වෙන්න පුළුවන්, අපිට ඒක අදාළ නැහැ. අපි දේශපාලනය තෝරාගෙන තියෙන්නේ රටට, ජාතියට මොනවා හරි කරන්න. අපේ හාමුදුරුවනේ අපේ සංස්කෘතිය ඉවරයි. සියලු ආගම්වල සංස්කෘතිය ඉවරයි.

දැන් බලන්න අපේ තිබිච්ච වැදගත් දෙයක් නැහැ අපේ හාමුදුරුවනේ. බුලත් විට සම්පූර්ණ වෙන්නේ දුම්කොළය තියලා දුන්නොත්. එහෙමනේ අපේ ඉතිහාසයේ සංස්කෘතිය. දැන් මොකක්ද කියන්නේ? බුලත් විටේ දුම්කොළ තිබුණොත් පොලීසියෙන් අල්ලනවා. අන්න සංස්කෘතියට ගහනවා. අන්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරනවා. හැබැයි දුම්කොළ කොටලා සිගරට්වලට දාලා කඩේ වික්කට කමක් නැහැ. දුම්කොළ තිබුණොත් නඩු දානවා.

මෙහෙම තමයි සංස්කෘතියක් විනාශ කරන්නේ. අපේ දුම්කොළ ඉතිහාසය, ශතවර්ෂ ගණනාවක් ඈතට යනවා. සියලු ආගම් ඉවරයි. සියලු ජාතීන් ඉවරයි. අපි ඒකට මේ නගරයෙන් අවශ්‍ය නායකත්වය දෙන්න තිබෙනවා. අද අපි සාර්ථක වුණේ ඇයි? අපි එකමුතුකම හින්දා.

අපිට දැනෙන විද්‍යාවට අනුව මේ ආණ්ඩුව වැඩි දුර යන්නේ නැහැ. අද මිනිස්සුන්ට බොහොම අමාරුයි. එක වේල කන තැනට පත්වෙලා. විශාල කඩා වැටීමක්.

මට නම් පේන්නේ ලෑස්ති වෙන්න ඕන අපේ චාමර ඇමතිතුමා කිව්වා වගේ ජනමත විචාරණයකට නෙමෙයි, මේ 159 යේ පාර්ලිමේන්තුව ඒගොල්ලා විසින්ම පෙරළනවා. ඒක පෙරළන්න කවුරුවත් ඕන නැහැ. ඒක ඒගොල්ලා දිනපතා කරගෙන යනවා.

දැන් අපි ලෑස්ති වෙන්න ඕනේ මොකටද? අපි ඔක්කොම එකට එකතු වෙලා කොහොමද මේක ගොඩනගන්නේ කියන එකයි අපි බලන්න ඕන? ඒකටයි ලෑස්ති වෙන්න ඕනේ. ආණ්ඩුව පෙරළන එක ආණ්ඩුව කරගෙන යනවා.

මතක තියාගන්න, මේ පාර්ලිමේන්තුව ලබන සිංහල අවුරුද්දට කලින් අවසන් වෙනවා කියලා ප්‍රකාශ කරමින්, ඔබ සියලු දෙනාටම ජය වේවා කියලා ප්‍රකාශ කරමින්, ඒකාබද්ධ විපක්ෂයට ජය වේවා කියලා ප්‍රකාශ කරමින්, මම ගිලින්න කියනවා ඒ අදාළ කරුණ ප්‍රකාශ කරන්න.

## මෙහිදී අදහස් දැක්වූ හිටපු අමාත්‍ය රාජිත සේනාරත්න මැතිතුමා

රටේ ජනතාවට පොරොන්දු ගොන්නක් දීලා බලයට ආව ආණ්ඩුව ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ වයස වැඩි කරන එකට තමයි අද ප්‍රමුඛත්වය දීලා තියෙන්නේ

මේක මේ රටේ තියෙන ලොකුම ප්‍රශ්නය? මේක කියලා මේ කට්ටිය කරන්නේ මොකක්ද?

මේකට ලංකාවේ නීතිඥ සංගමය විරුද්ධයි, ආසියානු නීතිඥ සංගමය විරුද්ධයි, පොදු රාජ්‍ය මණ්ඩලය නීතිඥ සංගමය විරුද්ධයි, එක්සත් ජාතීන්ගේ මානව කොමිසම විරුද්ධයි, සියලු බුද්ධිමතුන් විරුද්ධයි, එයාගේ පක්ෂයේ නියෝජිත නීතිඥයෝ විරුද්ධයි, මාලිමාවේ විධායක බලමණ්ඩලයේ ඉන්න ලාල් විජේනායක නීතිඥවරයාත් විරුද්ධයි. එයා කියනවා මාලිමාව මෙහෙම තීරණයක් ගත්තේ නෑ කියලා.

මේක ගේන්නේ අර ලාල් කාන්තලා කියනවා වගේ අපි ආණ්ඩුව ගත්තා, දැන් අපි රාජ්‍ය ගන්න තියනවා කියන කතාවටද? ඒ කියන්නේ දිසාපති තෝරන්නේ ඒගොල්ලෝ, නඩුකාරයෝ තෝරන්නේ ඒගොල්ලෝ. එහෙම තමයි කොමියුනිස්ට් රටවල.

මේ හැමදෙනාම තෝරගන්නේ ආණ්ඩුව. මැතිවරණ නෑ. ගාලු නගර සභාව තෝරන්නේ පැලවත්තේ. ගාලු ප්‍රාදේශීය සභාව තෝරන්නේ පැලවත්තෙන්. මෙන්න මේ තත්ත්වයට රට ගේන්න තමයි මේ උත්සාහ දරන්නේ.

දැන් මේ අනුර කුමාර දිසානායක යන්නේ රනිල් වික්‍රමසිංහ දාපු කාපට් එකේ. ඊටත් ඉහලින්, ඊටත් වේගෙන්. IMF එකත් එක්ක. සමාජවාදී රාජ්‍යයන්වල IMF එකත් එක්ක ගිහිල්ලා තියෙනවාද ලෝකේ කොහෙවත්? ඒකනේ කිව්වේ මේගොල්ලෝ IMF එකෙන් කවදාවත් ගොඩඑන්න බෑ, ගොඩ ආපු රටක් නෑ කියලා. මේ යන්නේ කෙලින්ම ධනපති ක්‍රමය යටතේ.

මේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය වෙනස් කරලා ඒකාධිපති ක්‍රමයක් ගේන එක තමයි ඔවුන්ගේ බලාපොරොත්තුව. ඒක තමයි රාජ්‍යය. ඒ කියන්නේ ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යය වෙනුවට ඒකාධිපති රාජ්‍යයක් ගොඩනැගීමේ වැඩපිළිවෙල විතරයි මෙතන තියෙන්නේ. වෙන එකක් නෑ.

## මෙහිදී අදහස් දැක්වූ එක්සත් ජනරජ පෙරමුණේ නායක පාඨලී චම්පික රණවක මහතා

ගාල්ලේ ජනතාවත්, ශ්‍රී ලංකාවේ ජනතාවත් මේ රටේ ජනාධිපතිවරයා හැටියට අනුර කුමාර දිසානායක මැතිතුමාව තෝරගෙන අදට දින 709යි.

ඒ වගේම ගාල්ල දිස්ත්‍රික්කයෙන් නවයෙන් හතක් පාර්ලිමේන්තුවට යවලා, හරිනි අමරසූරිය මැතිනියව රටේ අගමැති කරලා අදට දින 653යි.

ඔවුන් පොරොන්දු වුණේ මොකක්ද? පොහොසත් රටක්, ලස්සන ජීවිතයක්.

දැන් ඔබ පොහොසත්ද? ඔබට ලස්සන ජීවිතය ඇවිල්ලද? ඔබේ සාක්කුව පිරිලද? පසුම්බිය ලොකු වෙලද? හේවගේ මහත්තයාට කොහොමද? හඳුන්නෙත්ති මහත්තයාට කොහොමද? පොහොසත් රට, ලස්සන ජීවිතය කාටද උදා වෙලා තියෙන්නේ කියලා දැන් සියලු දෙනාම දන්නවා.

මැතකදී අපේ කළුතර දිස්ත්‍රික් අමාත්‍ය නලින්ද ජයතිස්ස මැතිතුමා කිව්වා, රෑට රෑට ජී. එල්. පීරිස් මහත්තයාගේ ගෙදර කුමන්ත්‍රණ කරන්නේ නැතුව මහාජනයා අතරට යන්න කියලා ඒකාබද්ධ විපක්ෂයට.

අද එතුමාට අපි කියනවා, අපි මාර්තු 29 පටන් ගත්තේ මේ ජනතාව අතරට යෑම. අද මේ ගාල්ල දිස්ත්‍රික්කයේ, මේ ගාල්ල පුරවරයේ, ගාල්ල නගර සභාවේ ජනතාව අතර මේ දහස් ගණන් ජනතාව එක්කයි ජනතාවාදී ඒකාබද්ධ විපක්ෂය ඉන්නේ.

හැබැයි රටේ ජනතාවට එරෙහිව, රටේ මිනිස්සු නොදන්නා කුඩා කණ්ඩායමක් එකතු වෙලා කුමන්ත්‍රණ කටයුතුත් කරගෙන යන්නේ ඔබයි ඔබේ පක්ෂයයි කියන එක නලින්ද ජයතිස්ස මැතිතුමාට ප්‍රකාශ කරනවා.

ඒ වගේම එතුමාට ස්තූතිවන්ත වෙනවා, නිල විපක්ෂයක් තියෙනවා, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීලා විශාල ප්‍රමාණයක් ඉන්නවා විපක්ෂයේ 66 දෙනෙක්. එහෙම තියෙද්දිත් මේ ජනතාවාදී ඒකාබද්ධ විපක්ෂයට චෝදනා කරන්න තෝරාගැනීමෙන්ම, මේ ආණ්ඩුවට තියෙන අභියෝගය කාගෙන්ද කියන එක පෙන්නලා දීම ගැන එතුමාට අපේ ස්තූතිය පිරිනමනවා මිතුරනි.

මම කැමතියි කතා කරන්න රටේ ආර්ථිකය ගැන පොඩ්ඩක්.

අද මේ ආණ්ඩුව කියනවා, ජනාධිපතිතුමා කියනවා, ඒ වගේම බිමල් රත්නායක ගරු ඇමතිතුමා කියනවා, ඒ වගේම අපේ විපක්ෂයේ හර්ෂ ද සිල්වා මහත්තයා එහෙමත්

කියනවා සල්ලි ගොඩගැහිලාලු. භාණ්ඩාගාරය පිරිලාලු. ටොන් වලින්ලු සල්ලි මනින්න තියෙන්නේ.

මිතුරනි, ඔබේ සාක්කුවේ සල්ලි තියෙනවද? නැහැ නේද? ඔබේ පසුම්බියේ සල්ලි තියෙනවද? නැහැ නේද?

සහගහන බදු ගහලා මිතුරනි ඒක ඇතිකරගෙන තියෙන්නේ. එදා අනුර කුමාර දිසානායක මහත්තයා මොකක්ද කිව්වේ? සෑම පෙට්‍රල් ලීටරයකින්ම රුපියල් 160ක් හොරකම් කරනවා කිව්වා කාංචන විජේසේකර. එදා රුපියල් 280යි පෙට්‍රල්. අද ඔබට රුපියල් 120ට පෙට්‍රල් හම්බවෙනවද?

රුපියල් 24ට තියෙනකොට විදුලි ඒකකය ආපු හැටියේ තුනෙන් එකකින් විදුලි ඒකකය අඩු කරනවායි කියලා කිව්වා. එහෙම අඩු වෙලා තියෙනවද?

මම ඔබට කියනවා වගකීමෙන්, රුපියල් 220ට සිංගප්පූරුවෙන් ගන්න පෙට්‍රල් ලීටරය තමයි රුපියල් 400 ගානකට අද ඔබට විකුණන්නේ. රුපියල් 240ට සිංගප්පූරුවෙන් ගන්න ඩීසල් ලීටරය තමයි අද ඔබට රුපියල් 380 ගානකට විකුණන්නේ.

සෑම මෝටර් සයිකලයක් පදින අපේ සියලුම දෙනා, සෑම ත්‍රීවීල් එකක් පදින සියලුම දෙනා, බස් එකේ ලොරියේ යන සියලුම දෙනා මතක තබා ගන්න ඕනේ, මේ ආණ්ඩුව පෙට්‍රල් ඩීසල් වලින් දවැන්ත කප්පමක්, දවැන්ත බදු ප්‍රමාණයක් ඔබෙන් අය කරන බව.

විදුලි බිල තුනෙන් එකකින් විදුලි බිල අඩු කරන්න ආපු අනුර කුමාර දිසානායක එතුමා මේ වෙනකොට 54%කින් විදුලි බිල වැඩි කරලා තියෙනවා.

ඒ වගේම අර ගල්අඟුරු වංචාවේ ප්‍රතිඵලයක් හැටියට අද ගල්අඟුරු ගෙන්න ගන්න බැරුව අද බලාගාර තුනෙන් එකක් වහලා මොකද කරන්නේ? ඩීසල් වලින් දුවවනවා බලාගාර.

මොකක්ද ප්‍රතිඵලය? සෑම මාසෙකටම කෝටි 1500 ගානේ ඉල්ලනවා විදුලිබල මණ්ඩලයේ දුවවන්න මිතුරනි. මේවා කොහෙන්ද එන්නේ? පාන්පිටි වලින්, කිරිපිටි වලින්, සීනි කිලෝවෙන්, හාල්මැස්සන්ගෙන්, අල ලූණු වලින් ඔබෙන් ගහන සහගහන බදු වලින් තමයි අද ඒවා කෙරීගෙන යන්නේ මිතුරනි.

ඒ නිසා මේ භාණ්ඩාගාරය පිරිලා ඉතිරිලා තියෙන්නේ කාගෙවත් සල්ලි නෙමෙයි ඔබේ සල්ලි. ඒ වගේම මතක තියාගන්න, මේ අය තවමත් ණය ගන්න සිද්ධ වෙලා තියෙනවා. කීයටද? 10.5%යේ පොලියට. 10.5%යේ පොලියට ගත්ත ණය තමයි අද භාණ්ඩාගාරයේ ගොඩගැහිලා තියෙන්නේ.

ඇයි ඒ භාණ්ඩාගාරයේ සල්ලි ගොඩගැහිලා තියෙන්නේ? රටේ සංවර්ධනයක් නැහැ. එදා ඔබට මතකයි, ඒ වජිර අබේවර්ධන මැතිතුමාට, අපිට මතකයි අපි මේ ගාල්ලේ උපායමාර්ගික සංවර්ධන වැඩපිළිවෙලක් ගෙනිච්චා මේ ගාල්ල නගරය ගොඩනගන්න. මේ මෝදර ඇලෙන් එන වතුර ටික ගාල්ල නගරය යට කරන එක, ගංවතුර පාලනය කරන්න. මේ නගරය අර අධිවේගී මාර්ගය ගාවට ගෙනිහිල්ලා දුම්රිය ස්ථානය, බස් නැවතුම එකට එකක් කරන්න.

ඒ වැඩපිළිවෙලවල් අද ඔක්කොම නතර වෙලා. ඔබේ ගමේ වේල්ල හැදෙන්නේ නැහැ, ඔබේ ගමේ ඇල මාර්ගය හැදෙන්නේ නැහැ, ඔබේ ගමේ පාර හැදෙන්නේ නැහැ. මුළු මාස පහටම සංවර්ධනයට වියදම් කරලා තියෙන්නේ 13%යි මේ ආණ්ඩුව.

දැන් පටන් අරන් තියෙනවා පරණ සෙල්ලම. මොකක්ද පරණ සෙල්ලම? අපේ ආණ්ඩුවත් මේකට අහුවුණා. මොකක්ද අධිවේගී පාරවල්වලට සල්ලි වත්කරන සෙල්ලම. පාරවල් පහක් තමන්ගේ හිතවත් සමාගම් කීපයකට ලබාදීලා, කෝටි ගණන් ගමේ සංවර්ධනය නවත්තලා, ගමේ පාර හදන එක නවත්තලා, ගමේ ඇල වේල්ල හදන එක නවත්තලා, ගමේ පාසල හදන එක නවත්තලා, ගමේ රෝහල හදන එක නවත්තලා, අද ඒගොල්ලන්ගේ ජාවාරම්කාරයෝ ටිකට පාරවල් පහක් හදන්න දීලා තියෙනවා.

අපේ ආණ්ඩුව රෑ වැටුණු වලේ මේ ආණ්ඩුව දවල් වට්ටන්න යනවා අපි සියලුදෙනාවම මිතුරනි. ඒක නිසා මතක තියාගන්න, මේ අය මේ කරගෙන යන මේ ක්‍රියාවලියේ අවසාන ප්‍රතිඵලය තමයි අපි ඉතාමත් භයානක උගුලකට පත්වෙන එක.

දැන් මොකක්ද 22 වුණේ? 22 රට බංකොලොත් භාවය 22 අප්‍රේල් 12 ප්‍රකාශයට පත් කළාට පස්සේ, 2022 සැප්තැම්බර් මාසේදී අපේ ණය ප්‍රතිව්‍යුහගත කරලා, එවකට ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා රටේ මුදල් ඇමති හැටියට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක එකඟතාවය ඇතිකරගත්තා. මොකටද? අවුරුදු පහක කාලයක් අපි ගත්තා 2027 වෙනකන් (23, 24, 25, 26, 27). මොකටද? රටේ ආර්ථිකය ස්ථාවර කරලා, රටේ ආර්ථික වර්ධනයක් ඇතිකරලා ණය ගෙවන්න පුළුවන් රටක් හදන්න ඒ අවුරුදු පහ ගත්තා.

ඒ ස්ථාවරත්වය පළවෙනි අවුරුදු දෙකේදීම ලංකාව ඇතිකරගත්තා. මේ මෑතකදී අපේ ජී. එල්. පීරිස් ඇමතිතුමා ඉංග්‍රීසි නාලිකාවක කිව්වා, මේ රටේ අභ්‍යන්තරයේ තියෙන මේ හැකියාව, මේ අර්බුද වලට මුහුණදෙන්න අපට තියෙන ඒ බලගතු ජීවගුණය ලොකුවට ඉවහල් වුණා අපේ රට මේ අර්බුදයෙන් ගොඩ එන්න මිතුරනි.

හැබැයි ඒ ගොඩ ආවට මතක තියාගන්න, අපට 2028 ඉඳන් ණය ගෙවන්න තියෙනවා. දේශීය ණය ගෙවන්න වෙනවා, විදේශීය ණය ගෙවන්න පටන් ගන්නවා අපි 28. විදේශීය වෙළඳපොලෙන් ගත්ත ණය අපට තියෙනවා ගෙවන්න 2039 දක්වා. විදේශීය රටවල්

වලින් ගත්ත ණය ගෙවන්න තියෙනවා 2042 දක්වා. ඒ ණය ගෙවන්න ආයෙත් අපට ණය ගන්න වෙලා තියෙනවා.

ඒවාට මොනම සූදානමක්වත් මේ රටේ තියෙනවද? මොනම ආකාරයකවත් අලුත් ඩොලර් උත්පාදන ක්‍රමවේදයක් මේ ආණ්ඩුවට තියෙනවද? නැහැ. මේ ආණ්ඩුවට කිසිසිම වැඩපිළිවෙලක් නැතුව සමාජ මාධ්‍ය වලින් සංදර්ශන පවත්වාගෙන, දළදා පෙරහැර වේවා, මෙට්‍රෝ බස් වේවා මේ ඔක්කොම සමාජ මාධ්‍ය වලින් දක්වන ඒ සංදර්ශන විතරයි මිතුරනි.

රටේ බස් 35,000ක් තියෙනවා. බස් 100ක් ගෙනල්ලා අපට පෙන්නනවා දැන් මුළු රටම මෙට්‍රෝ කියලා මිතුරනි. අද වෙනකන් බැරි වුණා මාස 10ක් ගියා ඒ මහනුවර දුම්රිය මාර්ගය හදන්න. අපේ හාමුදුරුවනේ, සුද්දා මේ දුම්රිය මාර්ගය අඹේපුස්සේ ඉඳන් මහනුවරට හැදුවේ අවුරුදු තුනෙන්. අලි ඇතුන්, වගවලස්සු ඉන්න රටේ උමං 11ක් හදලා, පාලම් අතිවිශාල ප්‍රමාණයක් දාලා දේශීය කම්කරුවෝ, ඉන්දියානු කම්කරුවෝ, අප්‍රිකානු කම්කරුවෝ ගෙනල්ලා කළේ.

මාස 12ක්, මාස 10ක් ගිහිල්ලත් අද වනකන් පුංචි පාලමක් හදාගන්න බිමල් රත්නායකට බැහැ, අනුර කුමාර දිසානායකට බැහැ. දැන් මොකද කරලා තියෙන්නේ? මේ මුළු පාරම බදුල්ල දක්වා ඉන්දියාවේ ඉර්කොන් (IRCON) සමාගමට බාරදෙන්න යනවා හදන්න කියලා.

මේ සුනාමියෙන් අපේ ගාල්ල පාර වැනසුනහම අපේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුවෝ, දුම්රිය දෙපාර්තමේන්තුවේ කම්කරුවෝ දින 52කෙන්... දින 52කෙන් බේරුවල ඉඳන් වැලිගමට මේ පාර ප්‍රතිස්ථාපනය කළා මිතුරනි. මාස 10ක් ගිහිල්ලත් තාම ඇසළ පෙරහැර බලන්න යන අපේ ජනතාවට පාර හදලා දුන්නේ නැහැ මිතුරනි. හැබැයි ලබන අවුරුද්දේ ඉඳන් විදුලි දුම්රිය දුවනවලු! ලබන අවුරුද්දේ ඉඳන් විදුලි දුම්රිය දුවනවලු!

මිතුරනි, මේ සංදර්ශන වලින් රටක් ගොඩනැගෙන්නේ නැහැ. රට ගොඩනගන්න ණයබර ගෙවන්න පුළුවන් ශක්තිමත් ආර්ථිකයක් ගොඩනගන වැඩපිළිවෙලක්, වැඩසටහනක් රටට අවශ්‍යයි.

පසුගිය අපේ රටේ ජනසංඛ්‍යා ලේඛන අනුව අවුරුදු 14යි 24යි අතර ජනතාව ලක්ෂ 32යි. මේ ලක්ෂ 32 දැන් ශ්‍රම වෙළඳපොලට එනවා. ඒ ශ්‍රම වෙළඳපොලට එන ඒ දරුවන්ට රැකියාව ලබාදෙන්න ඕනේ.

රැකියා එකක් ඇතිකරලා තියෙනවද? අලුත් එක රැකියාවක්, අලුත් එක ආයතනයක්, අලුත් එක ආයෝජනයක් මේ රටේ සිද්ධ වෙලා තියෙනවද? ලක්ෂ 32ක් අපේ දරුවන්ට රැකියා ලබාදෙන්න ඕනේ මිතුරනි. එකම මාර්ගය තමයි විදේශ රැකියා වලට දක්වන

එක. ඉතින් ඒ රටවල් වල කම්පන ඇතිවෙනකොට ඒ ප්‍රශ්නය විසඳීමේ තාවකාලික විසඳුමක් විතරයි ඒක.

එහෙනම් අපේ දරුවන්ට රැකියා ලබාදෙන්න, අලුත් ආයෝජන ගෙනෙන්න, අපේ ඵලදායිතාවය වැඩිදියුණු කරගන්න, අපේ තේ අස්වැන්න වැඩි කරගන්න, අපේ මත්ස්‍ය අස්වැන්න වැඩි කරගන්න, අපේ ගොවිතැන් වල අස්වැන්න වැඩි කරගන්න මොනම වැඩපිළිවෙලක්වත් මේ ආණ්ඩුවට තියෙනවද? කිසිසිඳු වැඩපිළිවෙලක් නැහැ මිතුරනි.

අන්න ඒ නිසා මතක තියාගන්න, අනාගතයේ ඉතාමත් භයානක තත්ත්වයක් උදාවෙන්න නියමිතයි. ඒ තත්ත්වයට මුහුණදෙන්න ශක්තිමත් අලුත් පරපුරක් අවශ්‍යයි. මට ඉතාම සතුටුයි අද මේ සභාව ආරම්භ කළේ තරුණ තරුණියෝ දෙන්නෙක් කතා කරලා. අන්න ඒ පරපුරට අවශ්‍ය වේදිකාව තැනීමයි මේ ජනතාවාදී ඒකාබද්ධ විපක්ෂය කරන්නේ කියන එක අපි ඔබට අද ප්‍රකාශ කරනවා මිතුරනි.

**මෙහිදී අදහස් දැක්වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජාතික සංවිධායක චාමර සම්පත් දසනායක මහතා**

ගාල්ල ගැන පොඩි වචනයක් කියන්න ඕන. දකුණ ගැන පොඩි වචනයක් කියන්න ඕන. ගාල්ලේ සීට් නමයයි, හතක්ම මාලිමාවට. මාතර සීට් හතයි, හයක්ම මාලිමාවට. හම්බන්තොට සීට් හයයි, පහක්ම මාලිමාවට. හැමදාම මේ රට වෙනස් කරපු මිනිස්සු ඉන්නේ මේ ගාල්ල සහ දකුණේ. මං හැමදාම කියනවා තරහ වෙන්න එපා කිව්වට, මක්කෙලා හුක්කෙල කියලා ඕගොල්ලෝ තමයි කෙළලා ඇරියේ.

මේක නැවත වෙන්න තියන්න බෑ. මේක වෙන්න තිබ්බොත් වෙන්නේ අපි ආවත්, කවුරු ආවත් කරන්න එපා මේක. දැන් මං අද උදේ අහනවා මගෙන්, මොකද වෙන්නේ ජනමත විචාරණයකට යනවාද, නැත්නම් තුනෙන් දෙකද? මං කිව්වා තුනෙන් දෙකක් නෙවෙයි, තුනෙන් දෙකටත් වැඩිය පාර්ලිමේන්තුවේ ඉන්නවා. 159ක් ඉන්නවා. 159ට තව දෙමළ සංධානයෙත් හේත්තු වුණොත් 165ක් වෙයි. තවත් අය හේත්තු වුණොත් 170ක්ම වෙයි. ඒ නිසා ජනමතය දෙනකොට බෙදලා, හදලා දෙන්න. මේ බෙදලා, හදලා නොදීපු හින්දා රැල්ලට ගහපු ගැහිල්ලේ නිසා තමයි මේක. තුනෙන් දෙකක් කියලා කිව්වත් ජනමත විචාරණයකට යන්න ඕන නෑ, තුනෙන් දෙකක් කියලා තිබ්බත් 140ක් දීලා තිබ්බා නම් ආණ්ඩුවට හුප්පේ. නමුත් මේ ආණ්ඩුව 159ක් තියාගෙන ඉන්නේ.

ඉතින් ඒක නිසා මිත්‍රවරුනි, මින් ඉදිරියට මේ දේශපාලන ගමන වෙනස් කරන්න ඕන. හැංගිලා වෙස්බැන්දට වැඩක් නෑ, එළියේ තමයි නටන්න වෙන්නේ. මං මේ ඒකාබද්ධ විපක්ෂ රැස්වීමේදී කියනවා, විපක්ෂයේ ඉන්න කවුරු හරි හිතනවා නම් අපිට තනියෙන් ගිහිල්ලා මේක කරන්න පුළුවන් කියලා, මේවා ආණ්ඩුවේ එලවන්න බෑ. එලවනවා නම් වජිර අබේවර්ධන ඇතුළු මේ ගාල්ල දිස්ත්‍රික්කයේ ඇවිල්ලා ඉන්න ඕගොල්ලොත් නැතුව කාට හරි තනියෙන් ඒ වැඩේ කරන්න බෑ මේ එලවන ආණ්ඩුව

එලවන්න. හැම විපක්ෂයේ ඉන්න නයි, මුගටි, පොළොංගු ඔක්කොම එකතු වෙන්න ඕන කියන එක මං මේ අවස්ථාවේදී කියනවා.

සමහරු හිතාගෙන ඉන්නවා අපේ වේදිකාවේ පහුගිය කාලයේ ඇවිල්ලා අපේ වේදිකාවටත් එනවා. අපේ වේදිකාවේ ඇවිල්ලා ඉස්සරහින් වාඩි වෙනවා. මගෙත් එක්ක මේවා කිව්වට මං කෙළින් කියන මිනිහෙක්. කවුරු මාත් එක්ක අමනාප වුණත්, කවුරු මාත් එක්ක තරහ වුණත් මට ඒකේ කිසිම ප්‍රශ්නයක් නෑ. මට හෙට ගාල්ලෙන් ඇවිල්ලා ඉල්ලුවත් මං දිනනවා. මං හෙට මාතරින් ඉල්ලුවත් චාමර දිනනවා. චාමර කොළඹින් ඉල්ලුවත් චාමර දිනනවා. ගම්පහින් චාමර ඉල්ලුවත් දිනනවා, ඒක වෙනම කතාවක්. හැබැයි මට නෑ මොළේ අමාරුවක් නෑ, ජනාධිපති මොළේ අමාරුකම් අපිට නෑ, අගමැති මොළේ අමාරුකම් නෑ, මුදල් ඇමතිකම් මොළේ අමාරුකම් අපිට නෑ.

දැන් තියෙනවා මේ සමහරු එනවා නිකන් මේ අපේ විපක්ෂය ගැන. අපි කියන්නේ ආණ්ඩුව හදන්න ඉස්සර වෙලා විපක්ෂය හදාගෙන ඉන්න ඕන. ආණ්ඩුව පෙරලන්න ඉස්සර වෙලා විපක්ෂය එකතු කරන්න ඕන. අපේ සමහරු එනවා අපේ රැස්වීම්වලටත් ඇවිල්ලා කතා කරනවා, මුලසුන ගන්නවා, මෙතනින් ගිහිල්ලා ආයේ වෙන වේදිකාවට නගිනවා. ආයේ ඒ වේදිකාවට ගිහිල්ලා බලනවා එතන හොඳයිද කියලා. කොයි වේදිකාවට නැග්ගත්, කොයි වේදිකාවේ හිටියත් ඉන්න ඕන විපක්ෂයේ.

මං මේ ජී.එල්. පීරිස් මහත්තයා ගැන සතුටු වෙනවා. ජී.එල්. පීරිස් කියන්නේ අවුරුදු 80කටත් වැඩි වයසක් තියෙන, මේ රටේ දේශපාලනය කරන, අද මේ ලපයි සිපයි ජේවීපීකාරයන්ට බය නැතුව, ගෙදර රැස්වීම් කරන්නේ මේ ජී.එල්. පීරිස් මහත්තයා. මේ තරුණ දේශපාලනඥයෝ මුන්ට බයේ හැංගෙනවා. නඩු දායි කියලා හැංගෙනවා. සමහර දිස්ත්‍රික්කවලට නායකත්වය දෙන උන් හැංගෙනවා. වේදිකාවලට එන්නේ නෑ හැංගෙනවා. රැස්වීමක කතා කරන්නේ නෑ හැංගෙනවා.

දැන් අනුර ජනාධිපතිතුමත් ලංකාව වටේ යන්න ලෑස්ති වෙලා ඉන්නවලු ආයේ පච ගොඩක් කියන්න. ඒ නිසා මේ රටේ මිනිස්සුන්ට මං කියනවා, මිත්‍රවරුනි, ඕවට ලෑස්ති වෙන්න එපා. ඕවට ලෑස්ති වෙලා එයාගේ බොරු අහපු කාලය ඉවරයි. ආයේ බොරු අහන්න ඉඩ තියන්නේ නෑ මෙගොල්ලෝ. මෙගොල්ලෝ කියපු බොරු හොඳට අවුරුදු දෙකක් අහලා ඉවරයි. කිසිම වැඩක් කරගන්න බෑ.

ඒ නිසා මෙගොල්ලෝ මේ යන වැඩපිළිවෙලට අපි බය නම් නෑ. අපේ කටවල් වහන්න නම් බෑ. අපි ඕවට බය නෑ. නඩු පිට නඩු දැම්මා කියලා බය වෙන්නෙත් නෑ. ඒ නිසා මං ගාල්ලේ මිත්‍රවරුන්ගෙන් ඉල්ලනවා වෙනස් කරන්න ඕන කාලය දැන් ඇවිල්ලා තියෙන්නේ. මෙහෙම ඇවිල්ලා මෙතන රැස්වීම අහගෙන ගිහිල්ලා ගෙදරට වෙලා ඉන්න එපා. 10ක් 15ක් හරි හදන්න.

## මෙහිදී අදහස් දැක්වූ හිටපු රාජ්‍ය අමාත්‍ය පියල් නිශාන්ත මහතා

අනුර කුමාර දිසානායක මැතිතුමත්, අධිකරණ ඇමති හර්ෂණ දිසානායකත් හිතාගෙන ඉන්නේ ඒගොල්ලන්ගේ තියෙන ගැටලුවට විතරයි විසඳුම් දෙන්න අමාත්‍යාංශ නිර්මාණය කරලා තියෙන්නේ කියලා.

ඒක නිසා ධීවර අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය මේ සියලුම අමාත්‍යාංශ ටික බැලුවොත් මේකට නායකත්වය දෙන අයගේ වගකීම ඉටු නොකරන කාලසීමාවකයි අපි මේ ඉන්නේ.

ඒ නිසා ඉතාමත්ම කණගාටුදායක තත්වයක් තියෙන්නේ. අපි මේ ජීවත් වෙන්නේ ඉතාමත්ම ඛේදනීය තත්ත්වයක. මේ රටේ අහිංසක ජනතාව බලාපොරොත්තු වුණේ රටට ගැලපෙන හොඳ දේශපාලන සංස්කෘතියක්.

අද මොකද වුණේ? ඒ සංස්කෘතිය ගොඩනගන්න ආපු අය අද අපේ රට අනාථ කරලා, නන්නත්තාර කරලා, කුජීත කරන මට්ටමට පත් කරමින් යනවා. ඒක ඉතාමත්ම කණගාටුදායක තත්ත්වයක්.

අපි පැහැදිලිවම දන්නවා 3% බලයේ තිබිච්ච අය ගෙයින් ගෙට ගිහිල්ලා, ගමින් ගමට ගිහිල්ලා, නගරයෙන් නගරයට ගිහිල්ලා මොකක්ද කිව්වේ?

මේ රට ඉතාමත්ම හොඳ සුන්දර, ලස්සන රටක් නිර්මාණය කරන්න ඒ අයට ඡන්දය දෙන්න කියලා. ඒ සුන්දර කතාවලට, ඒ සුන්දර ලෝකයට අපේ වැඩි පිරිසක් ජනතාව රැවටුණා. රැවටිලා අද වෙනකොට ජනතාව කටුක ජීවිතයක් ගත කරන මට්ටමට පත් වෙලා තියෙනවා. ඒ වගේම තමයි මේ 3% ජේ.වී.පී ප්‍රමුඛ මේ මාලිමාවේ අය හිතාගෙන හිටියේ මේ රට සුරපුරයක් කරන්න කියලා.

කයිවාරුකාරයින්ට, වැඩක් බැරි, වැඩ බැරි ටාසන්ලට එහෙම කරන්න බැහැ. අත්දැකීම් තියෙන්න ඕනේ. දේශපාලනය පිළිබඳව යම් පන්නරයක් ලබාගත්තු පිරිසක් වෙන්න ඕනේ. පොරොන්දු දුන්න අය අද ගලේ පහරපු බලල්ලු බවට පත් වෙලා තියෙනවා, ඡන්දය දුන්න අය ඇටි කෙහෙල් කාපු ගුඩෝ බවට පත් වෙලා තියෙනවා.

ඒ නිසා සැබෑ දේශපාලන සංස්කෘතිය නිර්මාණය කරන්නට අපි හැම කෙනෙකුටම ලොකු වගකීමක් තියෙනවා. ඒ වගකීම ඉටු කරන්න තමයි අපි ගමින් ගමට, නගරයෙන් නගරයට මේ විදියට එකාබද්ධ විපක්ෂය හැටියට කටයුතු කරමින් ගමන් කරන්නේ.

අනුර කුමාර දිසානායක මැතිතුමා ඇතුළු මේ ආණ්ඩුවේ ඉන්න හෙන්චයියලා ටික මොකක්ද කිව්වේ? කිව්වේ දූෂණයෙන්, වංචාවෙන්, බොරුවෙන් තොර රටක් නිර්මාණය කරනවා කියලා. අද ඉතාමත්ම නරක අතට මේ රට පත්වෙමින් යනවා.

කොහොමද අධ්‍යාපනය පිළිබඳව අධ්‍යාපන ක්ෂේත්‍රයේ අයට දුන්න පොරොන්දු ටික? 6%කට වැඩි මුදලක් අධ්‍යාපනයට වෙන් කරලා තියෙනවාද? එතකොට වැටුප් විෂමතා දැන් නිවැරදි ක්‍රමවේදයකට ගුරුවරුන්ට ලබා දෙනවාද? මාස 6න් මාස 6ට ගුරුවරුන්ගේ වැටුප් වැඩි වෙනවාද?

ඊළඟට විශ්වවිද්‍යාල පද්ධතිය ඇතුළේ මහ දැවැන්ත වෙනසක් කරනවා, ඒ වෙනස ඇති කරලා තියෙනවාද? ලෝකයේ ප්‍රධානතම අධ්‍යාපනයේ ප්‍රධානතම අරමුණක් හැටියට මූලිකව පෙරපාසල් අධ්‍යාපනයට දුන්නු ප්‍රමුඛත්වය දෙනවා කිව්වා, දැන් පෙරපාසලට ඒ ප්‍රමුඛත්වය ලබා දීලා තියෙනවාද?

අද ඉතාමත්ම නරක තැනකට කෘෂිකර්මාන්තය ඇදවැටෙමින් පවතිනවා. වී ගොවියාට සාධාරණ මුදලක් ඉල්ලනකොට අද ඇමතිවරයා ගොවියාට තග දාන මට්ටමට අද පත් වෙලා තියෙනවා. ගොවියාව සත පහකට ගණන් ගන්නේ නැතුව, ගොවි ජනතාව ඉතාමත්ම අසරණ තත්වයට අද පත් වෙලා තියෙනවා.

ධීවර කර්මාන්තය, මේ ප්‍රදේශයේ මම හිතන්නේ ධීවර කර්මාන්තයේ සිටින ජනතාව වැඩියි.

එදා මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ යුගයේත්, රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ යුගවලදීත් මේ ධීවර කර්මාන්තයට කරපු සේවය, 'දළ රළ සවිය' කියන වැඩසටහන තුළ මොන තරම් වැඩසටහන් ක්‍රියාත්මක කරාද?

ඒක නිසා ආදරණීය අම්මේ, තාත්තේ, මේ වර්තමානයේ ඇති වෙලා තියෙන දේශපාලන, සමාජීය සහ ආර්ථික දැවැන්ත අර්බුදයෙන් ගොඩඑන්න නම් මේ ආණ්ඩුව පරාජයට පත් කළ යුතුමයි.

ඒ කටයුත්ත වෙනුවෙන් පෙළගැහෙන්න කියන ඒ ආයාචනය කරමින් ආදරණීය ඔබ සියලුදෙනාටම ජය වේවා! කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**මේ අවස්ථාවට ගෞරවණීය මහා සංඝරත්නය, අන්‍යාගමික පූජක ප්‍රසාදීන්, හිටපු කතානායක මහින්ද යාපා අබේවර්ධන, හිටපු අමාත්‍යවරුන් වන නිමල් සිරිපාල ද සිල්වා, සාගල රත්නායක, ලසන්ත අලගියවන්න, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන නිශාන්ත මුතුහෙට්ටිගම, අසංක නවරත්න, හිටපු ආණ්ඩුකාර අසාත් සාලි ඇතුළු දේශපාලන පක්ෂ නායකයින්, නියෝජිතයින්, විද්වතුන් ඇතුළු විශාල පිරිසක් සහභාගීව සිටියහ.**